සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 8 ශ්‍රේණිය | ඉතිහාසය | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි:
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට බලපෑ ආක්‍රමණය කුමක් ද?
(1) විජය (2) කාලිංග මාඝ (3) පාණ්ඩ්‍යය (4) චෝල

02. සාහිත්‍ය මූලාශ්‍රයවලට අනුව මෙරට ඉදි වූ මුල් ම දාගැබ වන්නේ,
(1) ථූපාරාමය යි. (2) මිරිස වැටිය යි.
(3) රුවන්වැලි සෑය යි. (4) රන්කොත් වෙහෙරයි.

03. අනුරාධපුර ඇතුළු නුවර පිහිටි විජයබා මාලිගය කුමන රාජධානි සමයක ඉදිකරන ලද්දක් ද?
(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) දඹදෙණිය (4) කුරුණෑගල

04. ජයවීර බණ්ඩාර රජුගෙන් පසුව උඩරට රජ බවට පත් වූයේ කවුරුන් ද?
(1) සේනා සම්මත වික්‍රමබාහු (2) කොනප්පු බණ්ඩාර
(3) වීරසුන්දර බණ්ඩාර (4) කරලියද්දේ බණ්ඩාර

05. බ්‍රිතාන්‍ය අත්අඩංගුවට පත් වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන් විසින් රැගෙන යන ලද්දේ,
(1) පෘතුගාලයට ය. (2) ඕලන්දයට ය.
(3) වෙල්ලෝරයට ය. (4) බ්‍රිතාන්‍යයට ය.

- **අංක 06 - 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් වරහන තුළ (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. වැව් බැම්ම සේදී යාම වළක්වා ගැනීම සඳහා පිටවාන ඉදිකර ඇත. ( )

07. රජවරුන්ගේ පරිහරණය සඳහා රන්මසු උයන ඉදිකර ඇත. ( )

08. ඉසුරුමුණියේ පිහිටි පෙම් යුවළ කැටයම පොළොන්නරු යුගයට අයත් කැටයමකි. ( )

09. ශ්‍රී විජය රාජසිංහ රජතුමා නායක්කර් වංශික පාලකයෙකි. ( )

10. මහනුවර යුගයේ දී ටැම්පිට විහාර ඉදිකිරීමේ සම්ප්‍රදායක් පැවතුණි. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර, පහතින් දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැන මත ලියන්න.**

11. වසභ රජතුමා විසින් ...................................................................... ඇල ඉදිකරවන ලදී.

12. ධාතුසේන රජතුමා විසින් කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙනයාම සඳහා .............................................. ඉදිකරන ලදී.

13. රජරට සමයට අයත් කලාත්මක ම වටදාගෙය වනුයේ ............................................................ වටදාගෙය යි.

14. පෘතුගීසීන් විසින් තම රැකවරණය ලබා සිටි කරළියද්දේ බණ්ඩාරගේ බෑනා වූ ...................................................... උඩරට යවා එහි රජු ලෙස පත් කරන ලදී.

15. ලන්දේසීන් සතුව තිබූ ශ්‍රී ලංකාවේ මුහුදබඩ ප්‍රදේශය ........................................................ රජතුමාගේ පාලන අවධියේ දී ඉංග්‍රීසීන් විසින් අල්ලා ගන්නා ලදී.

(ශ්‍රී වික්‍රම රාජසිංහ / මිනිපේ / ජයගඟ / මැදිරිගිරිය / රාජාධිරාජසිංහ / යමසිංහ බණ්ඩාර / ඇළහැර)

- **අංක 16 - 20 දක්වා I තීරුවේ සඳහන් තොරතුරු හා සම්බන්ධ පිළිතුර II තීරුවෙන් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

16.

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1. | තිසා වැව | A - | මහසෙන් රජු |
| 2. | ජය වැව | B - | දේවානම්පියතිස්ස රජු |
| 3. | හුරුළු වැව | C - | පණ්ඩුකාභය රජු |
| 4. | මඩාටුගම වැව | D - | ධාතුසේන රජු |

(1) ABCD (2) BCAD (3) BADC (4) CBAD

17

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1. | දැදිගම | A - | මිරිසවැටිය |
| 2. | පොලොන්නරුව | B - | කිරිවෙහෙර |
| 3. | අනුරාධපුරය | C - | කොටවෙහෙර |
| 4. | මාගම | D - | තිස්සමහාරාම දාගැබ |

(1) ABCD (2) BCAD (3) BADC (4) CBAD

18.

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1. | රෝහල | A - | අශ්ව හිස සහ මිනිසා |
| 2. | රජ මාළිගය | B - | ථූපාරාමය |
| 3. | පිළිමගෙය | C - | ආළාහන පිරිවෙන |
| 4. | කැටයම | D - | වෛජයන්ති ප්‍රාසාදය |

(1) ADCB (2) BACD (3) CBAD (4) CDBA

19.

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1. | කුසුමාසන දේවිය | A - | දෝන කතිරිනා |
| 2. | යමසිංහ බණ්ඩාර | B - | මහා ආස්ථාන |
| 3. | කොනප්පු බණ්ඩාර | C - | දොන් ජුවන් |
| 4. | දෙවන රාජසිංහ | D - | දොන් පිලිප් |

(1) ADCB (2) BACD (3) CBAD (4) CDBAä

20.

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1. | යකඩ කර්මාන්තය | A - | මැදවෙල |
| 2. | පන් කර්මාන්තය | B - | කොත්මලේ |
| 3. | ලී කැටයම් | C - | දුම්බර |
| 4. | ටැම්පිට විහාරය | D - | ඇම්බැක්ක |

(1) BCDA (2) BCAD (3) BADC (4) CBAD

(මුළු ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීම සඳහා වෙන ම කඩදාසි භාවිත කරන්න.

---

01. (A) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(ii) එය දැකගත හැක්කේ කුමන නගරය ආසන්නයේ දී ද?

(iii) එම ඉදිකර ඇති වාස්තුවිද්‍යා ශෛලිය කුමක් ද?

(iv) මෙම ගොඩනැගිල්ල කුමන ආගමිකයින්ට අයත් වූවක් ද?

(ලකුණු 04)



(B) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන සිතුවම කුමක් ද?

(ii) එය කුමන රාජධානි සමයකට අයත් ද?

(iii) මෙම සිතුවම් කුමන සියවසකට අයත් ද?

(iv) වල්බිහිව තිබූ මෙම සිතුවම් ඇද ඇති ස්ථානය, නැවත පාදාගන්නා ලද විදේශීය පුරාවිද්‍යාඥයෙකු නම් කරන්න.

(ලකුණු 04)




(C) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන පැරණි නගරය කුමක් ද?

(ii) එම නගරය ආසන්නයෙන් ගලායන ප්‍රධාන ගංගාව කුමක් ද?

(iii) මෙම නගරය මුල්කරගෙන පළමුවරට ස්වාධීන පාලන ඒකකයක් ගොඩනැගූ පාලකයා කවුරුන් ද?

(iv) මෙම රාජධානියට ආරක්ෂාව සපයන කඳුවැටියක් නම් කරන්න.

(ලකුණු 04)




(D) (i) ඉංග්‍රීසි A අක්ෂරයෙන් දැක්වෙන්නේ, කුට්ටම් පොකුණ දැකගත හැකි රාජධානිය යි. එය හඳුනාගෙන නම් කරන්න.

(ii) මහනුවර රාජධානිය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(iii) ඉංග්‍රීසි D අක්ෂරයෙන් දැක්වෙන්නේ, භයවන පරාක්‍රමබාහු රජුගේ රාජධානිය යි. එය හඳුනාගෙන නම් කරන්න.

(iv) ඉංග්‍රීසි C අක්ෂරයෙන් දැක්වෙන්නේ, පරාක්‍රම සමුද්‍රය පිහිටි රාජධානිය යි. එය නම් කරන්න.

(ලකුණු 04)




02. (i) ජල තාක්ෂණය පෙන්නුම් කරන ජලය ආශ්‍රිතව තැන වූ නිර්මාණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වැව් ඉදිරිකිරීමේ දී මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| පින්තූරය |  |  |  |
|---|---|---|---|
| වැවේ අංග | රළපනාව | A ................................ | පිටවාන |
| ඉටුකරගත් කාර්යය | B ................................ | C ................................ | D ................................ |

03. (i) අනුරාධපුර රාජධානි සමය තුළ දී ඉදි වූ උද්‍යාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පොකුණු තැනවීමේ අවශ්‍යතා දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පහත ඡායාරූප හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)



A ................................................



B ................................................



C ..................................................



D ..................................................

04. (i) පහත සඳහන් කාර්යන් හි නිරත ශිල්පීන් අතීතයේ හැඳින් වූ නම් ලියා දක්වන්න.

A - ලෝහ වැඩ කරන්නා -

B - තඹකරු -

C - බෙලෙක් වැඩ කරන්නා - (ලකුණු 03)

(ii) අතීත ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ බවට සාධක හමුවන ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මැටි බඳුන් සකස් කිරීමේ දී අනුගමනය කළ පියවර හතරක් නම් කරන්න. (ලකුණු 04)

05. (i) අනුරාධපුර යුගයේ මැද කාලයේ දී ලංකාවේ නිර්මාණය කරන ලද දාගැබ්වල දැකිය හැකි ප්‍රධාන අංග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත දාගැබ් නිර්මාණය කරන ලද රජවරුන් නම් කරන්න.

A. අභයගිරිය

B. ජේතවනය

C. රන්කොත් වෙහෙර

D. දෙමළ මහ සෑය (ලකුණු 04)

(iii) රජරට ශිෂ්ටාචාර සමයට අයත් ආගමික නොවන ගොඩනැගිලි හතරක් නම් කරන්න. (ලකුණු 04)

06. (i) මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පළමුවන විලමධර්මසූරිය රජතුමා බුදු දහම නගා සිටුවීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජධානිය හා පෘතුගීසි අතර ඇති වූ සටන් සම්බන්ධ තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| වර්ෂය | සටන සිදු වූ ස්ථානය | උඩරට රජතුමා | පෘතුගීසි සෙන්පතිවරයා |
|---|---|---|---|
| 1594 | A .......................... | පළමුවන විමලධර්මසූරිය රජතුමා | B .......................... |
| 1630 | රන්දෙණිවල | C .......................... | D .......................... |

07. පහත ඡායාරූප සටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C



D



E



F



G

(1) ඉංග්‍රීසි C අක්ෂරයෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?

(2) එතුමා කුමන රාජ වංශයකට අයත් පුද්ගලයෙක් ද?

(3) මෙම රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද විහාරස්ථානයක පින්තූරයක් මෙහි දැක්වේ. එම විහාරස්ථානය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(4) එම විහාරස්ථානය නම් කරන්න.

(5) ඉංග්‍රීසි E අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(6) එම ගොඩනැගිල්ල ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ කුමන කලාවක් සඳහා ද?

(7) ඉංග්‍රීසි F අක්ෂරයෙන් දැක්වෙන කුරහන්ගලෙහි සඟවා තිබූ පූජා වස්තුව කුමක් ද?

(8) එය මහනුවරට වැඩමකළ රජතුමා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(9) එම පාලකයා නම් කරන්න.

(10) පෘතුගීසීන් ලංකාවෙන් පළවා හරින ලද පාලකයා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(11) ඉංග්‍රීසි D අක්ෂරයෙන් දැක්වෙන පින්තූරයෙන් නිරූපිත ස්වාමීන් වහන්සේ කවුරුන් ද?

(ලකුණු 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | (2) | 02. | (1) | 03. | (2) | 04. | (4) | 05. | (3) |
| 06. | ✗ | 07. | ✓ | 08. | ✗ | 09. | ✓ | 10. | ✓ |
| 11. | ඇළහැර | 12. | ජයගඟ | 13. | මැදිරිගිරිය | 14. | යමසිංහ බණ්ඩාර | 15. | රාජාධි රාජසිංහ |
| 16. | (2) | 17. | (4) | 18. | (4) | 19. | (1) | 20. | (1) |

(2 x 20 = ල. 40)

## II කොටස

01. (A) (i) ශිව දේවාලය / ශිව දේවාලය අංක II (ii) පොළොන්නරුව
(iii) චෝළ (iv) හින්දු
(B) (i) සීගිරි චිත්‍ර / සීගිරි අප්සරාවන් /සීගිරි කාන්තාවන් (ii) අනුරාධපුරය
(iii) ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස (iv) එච්. සී. පී. බෙල්
(C) (i) මහනුවර (ii) මහවැලි
(iii) සේනා සම්මත වික්‍රමබාහු (iv) උඩවත්ත / හන්තාන
(D) (i) අනුරාධපුරය (ii) B
(iii) කෝට්ටේ (iv) පොළොන්නරුව

02. (i) වැව් / ඇළ / වේළි / පොකුණු / ජල මල්
(ii) වැවේ ජල ධාරිතාවේ පීඩනයට ඔරොත්තු දෙන ලෙස වැව් බැම්ම නිර්මාණය. / ශ්‍රමය සපයා ගැනීම. / ශ්‍රමිකයක් හැසිරවීම. / ආහාරපාන සැපයීම / පස් එක් රැස් කිරීම./ පස් තලා ගැනීම.
(iii) A - සොරොව්ව B - වැව් බැම්ම සේදීයාම වැළැක්වීම.
C - වැවෙන් ජලය පිටතට ලබා ගැනීම. D - වැවට ලැබෙන අතිරික්ත ජලය පිට කිරීම.

03. (i) මහමෙවුනා (මහාමේඝ) / සීගිරිය / රන්මසු උයන / පද්මස්වර / නන්දන උයන
(ii) පරිභෝජනය සඳහා / වැසි ජලය ක්‍රමානුකූලව බැහැර කිරීම සඳහා / අලංකරණය සඳහා / පරිසරය සිසිල්ව තබා ගැනීම සඳහා
(iii) A - කුට්ටම් පොකුණ B - නෙළුම් පොකුණ C - සීගිරිය / ජලමල් / සීගිරි උයන
D - රන්මසු උයන

04. (i) A - කබර (කම්මාර) B - තඹර C - තොපජ
(ii) සමනල වැව ප්‍රදේශය (බලංගොඩ සමනල වැව ප්‍රදේශය) / දෙහිගහ ඇළ කන්ද ප්‍රදේශය (සීගිරිය අලකොළවැව දෙහිගහ ඇළකන්ද)
(iii) සුදුසු මැටි වර්ගය තෝරා ගැනීම. / මැටි පදම් කිරීම. / සකපෝරුව යොදාගෙන මැටි බඳුන් සැකසීම. / අලංකාර කිරීම. / වියළීම / උදුනේ තබා පිළිස්සීම.

05. (i) පාදම / පේසා වළලු / ගර්භය / හතරැස් කොටුව / දේවතා කොටුව / කොත ආදී
(ii) A - වළගම්බා B - මහසෙන් C - නිශ්ශංකමල්ල
D - පළමු පැරකුම් /මහ පැරකුම්
(iii) රජමාළිගා / බලකොටු / රෝහල් / නිවාස / වැසිකිළි කැසිකිළි / රාජසභා මණ්ඩප වැනි

06. (i) සෙංකඩගල / කන්ද උඩරට / උඩරට / කන්දේ නුවර
(ii) බුරුම දේශයෙන් උපසම්පදාව වැඩම කරවීම. / ලංකාතිලකය ගඩලාදෙණිය වැනි වෙහෙර විහාර අලුත්වැඩියාව / දෙල්ගමුව විහාරයේ වැඩසිටි දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීම.
(iii) A - දන්තුරේ සටන B - පේරෝ ලොපෙස් ද සූසා C - සෙනරත් රජු
D - කොන්ස්තන්තිනෝ ද සා

07. (1) කීර්ති ශ්‍රී රාජසිංහ (2) නායක්කර් (3) G (4) දඹුලු විහාරය
(5) ඇම්බැක්ක දේවාලය (6) ලී කැටයම් (7) දළදා වහන්සේ (8) A
(9) පළමු විමලධර්මසූරිය (10) B (11) වැලිවිට සරණකර හිමි (සරණංකර හිමි)